සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

**අ.පො.ස (උසස් පෙළ) උපකාරක පරීක්ෂණය-2024**
க.பொ.த (உயர்தர) உதவிப் பரீட்சை-2024
**Support Test Paper for G.C.E (A/L)**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 13 | විෂයය / பாடம் / Subject: පෙරදිග සංගීතය | පත්‍රය / வினாத்தாள் / Paper: I | පැය / மணித்தியாலம் / Hours: 02 |

**උපදෙස් : සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සැපයිය යුතුය.**

- **අංක 01 සිට 30 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී නිවැරදි හෝ ඉතාම ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය ප්‍රශ්නය ඉදිරියෙහි ඇති වරහන තුළ ලියන්න.**

1) 'මධ්‍යමය' වාදී ස්වරය ලෙසත් 'සඩ්ජය' සංවාදී ස්වරය ලෙසත් යෙදෙන රාග යුගලය තෝරන්න.
   i. භාගේශ්‍රී - දේස්
   ii. දේස් - ආසාවරී
   iii. භාගේශ්‍රී - මාල්කෞන්ස්
   iv. ජයජයවන්ති - ආසාවරී
   v. හංසධ්වනී - තිලක්කාමෝද්
   (...............)

2) මග රිග සරි නිස | නිධ පධ මප නිස | මග රිග සරි නිස | නිධ පම ගරි ගස | යන තානාලංකාරය අයත් රාගය කුමක්ද?
   i. භාගේශ්‍රී
   ii. ජයජයවන්ති
   iii. ආසාවරි
   iv. දේස්
   v. හංසධ්වනි
   (...............)

3) දේස් සහ තිලක්කාමොද් රාග යුගලය
   i. සම්ප්‍රකෘති රාග වේ.
   ii. පරමේල ප්‍රවේශක රාග වේ.
   iii. උත්තරාංග වාදී රාග වේ.
   iv. උදය සන්ධි ප්‍රකාශ රාග වේ.
   v. සවස සන්ධි ප්‍රකාශ රාග වේ.
   (...............)

4) ආරෝහණ අවරෝහණ ක්‍රමය මත පිහිටා ගොඩනැඟෙන තානාලංකාර වර්ගය හඳුන්වන්නේ
   i. වක්‍ර තාන් නමිනි.
   ii. මිශ්‍ර තාන් නමිනි.
   iii. බෝල් තාන් නමිනි.
   iv. කූට තාන් නමිනි.
   v. සපට් තාන් නමිනි.
   (...............)

5) රාග ආලාප ගායනය හෝ වාදනය කිරීමේදී වඩාත්ම ප්‍රයෝජනවත් වනුයේ
   i. රාග සංගතිත්ය
   ii. රාග පල්ටාය
   iii. ලක්ෂණ ගීතය
   iv. රාගයේ ආරෝහණය
   v. රාගයේ අවරෝහණය
   (...............)

6) මහා කවි ජයදේව විසින් රචනා කරන ලද සංගීතමය පද්‍ය ග්‍රන්ථය වන්නේ
   i. රාමායණය
   ii. ගීත්ගෝවින්දය
   iii. බෘහත්දේශී
   iv. ගාන්ධර්ව විද්‍යා
   v. සංගීත සංහිතා
   (...............)

7) රාගයේ ගායන සමය තීරණය කිරීමේදී "අද්වදර්ශක" නැතහොත් "සමයදර්ශක" ලෙස හැඳින්වෙන්නේ
   i. 'ස' ස්වරයයි
   ii. 'රි' ස්වරයයි
   iii. 'ග' ස්වරයයි
   iv. 'ම' ස්වරයයි
   v. 'ප' ස්වරයයි
   (...............)

8) ආරෝහණයේදී "රි" ස්වරය දුර්වල බවක් දැක්වෙතත් අවරෝහණයේදී "රි" ස්වරය ප්‍රබලව යෙදෙන කර්ණාටක පද්ධතියට ආවේණික රාගය වන්නේ

i. දේස් රාගයයි.
ii. තිලක්කාමෝද් රාගයයි.
iii. හංසධ්වනි රාගයයි.
iv. ජයජයවන්ති රාගයයි.
v. භාගේශ්‍රී රාගයයි.

(...............)

9) ජය ජයවන්ති රාගය සම්බන්ධව නිවැරදි තොරතුර වන්නේ

i. ඖඩව සම්පූර්ණ රාගයකි.
ii. ගු සහ නි වාදී සංවාදී වෙයි.
iii. රාත්‍රී ප්‍රථම ප්‍රහරයේ ගැයේ.
iv. සෝරට් අංග සහ ගෞඩබිලාවල් අංග සම්මිශ්‍රණයකි
v. කළ්‍යාණ මේල ගත රාගයකි.

(...............)

10) "රි" ස්වරය සහ "ධ" ස්වරය ආන්දෝලනය කෙරෙන උදය සන්ධි ප්‍රකාශ රාගයකි

i. භෛරව
ii. භාගේශ්‍රී
iii. කාලිංගඩා
iv. මාල්කෞන්ස්
v. ජයජයවන්ති

(...............)

11) ඛ්‍යාල් හා තරණා ගායනයේදී, ඨුම්රි ටප්පා සහ ධූන් වාදන සඳහා බෙහෙවින් උපයෝගී කරගන්නා නිර්දේශිත තාල දෙකක් වන්නේ

i. චෞතාල් සහ ඒක්තාල්ය
ii. ධමාර් සහ ත්‍රිතාල්ය
iii. බෙම්ටො සහ දාධරාය
iv. ත්‍රිතාල් සහ පංජාබිය
v. ධමාර් සහ තිලවඩාය

(...............)

12) මාත්‍රා සංඛ්‍යාව සහ තාල සංඥා සමාන වන තාල යුගලයකි.

i. ධමාර් තාලය සහ දීප් චන්දිතාලය
ii. ඒක්තාලය සහ ධමාර් තාලය
iii. පංජාබි තාලය සහ ඒක්තාලය
iv. ත්‍රිතාලය සහ දීප්චන්දි තාලය
v. චෞතාලය සහ තිලවඩතාලය

(...............)

13) භාරතීය සංගීතයේ, හින්දුස්ථානි සහ කර්ණාටක වශයෙන් පද්ධති දෙකක් බිහි වූයේ

i. සංගීත විශ්වවිද්‍යාල බිහිවීමෙන් පසුවය.
ii. සරාණා හෙවත් ගුරුකුල වශයෙන් බෙදුන නිසාය.
iii. බටහිර සංගීතයේ ආභාසය නිසාය.
iv. දෙවියන් කෙරෙහි වූ විශ්වාසය නිසාය.
v. පර්සියානු සංගීතයේ බලපෑම නිසාය.

(...............)

14) වේද ගීතිකා ගායනා කළ යුතු ආකාරය විස්තර වී ඇත්තේ

i. ඍග් වේදයේය.
ii. යජුර් වේදයේය.
iii. සාම වේදයේය.
iv. අථර්වන් වේදයේය.
v. උපනිෂද් වේදයේය.

(...............)

15) ගෝත්‍රික ගී අනුසාරයෙන් නිර්මාණය වූ රාගයකි

i. ආසාවරී
ii. භෛරව
iii. හංසධ්වනි
iv. තිලක්කාමෝද්
v. ජයජයවන්ති

(...............)

16) 'පන්කජ් උද්දාස්' නමැති ඉන්දියානු සංගීතඥයා

i. ධ්‍රැපද් ගායකයෙකි.
ii. ඨුම්රි ගායකයෙකි.
iii. ඛ්‍යාල් ගායකයෙකි.
iv. කව්වාලි ගායකයෙකි.
v. ගසල් ගායකයෙකි.

(...............)

17) "සුළු මහ දෙතිත"ට අනුව ගායනා කළ හැකි කවි පදයකි

i. සුරිඳුන් පෙර සිටන්
ii. අකුලා ගෙන සොඬ කන්පොතු නෙරවා
iii. දැන් සොඳුර තනිවම
iv. මංගලම් මෙ සබේ සැමටම
v. පෙම්මා සුරතල් කියමින්

(...............)

18) කවිකාර මඩුව හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක්ද?

i. පිනුම්කාරයන්, යුද හරඹ කාරයන්, ඉන්ද්‍රජාල ආදියෙන් සමන්විතය.
ii. මුහන්දිරම් නිලමේවරයෙකු යටතේ පැවති නැටුම් ගැයුම් වැයුම් පැවැත්වූ ස්ථානයයි.
iii. නෛඩි, වෙස්, පන්තේරු, උඩැක්කි යන නැටුම් වර්ග 4 ක් පැවැත් වූ ආයතනයකි.
iv. දවුල්, තම්මැට්ටම්, හොරණෑවලින් සමන්විත ආයතනයකි.
v. දේශීය තූර්ය භාණ්ඩ, බෙර, සුෂිර වාදක භාණ්ඩ වලින් සමන්විත ආයතනයකි. (...............)

19) 'පොතේ සින්දුව', 'ඉන්නිසිය', 'අගහාරං' ආදී ලක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකාවේ ප්‍රචලිත රංග ශෛලිය කුමක්ද?

i. කෝළම්
ii. සොකරි
iii. නව නාට්‍ය
iv. නූර්ති
v. නාඩගම්

(...............)

20) බටහිර ඔපෙරා ආකෘතිය අනුගමනය කරමින් මෙරට ගොඩනැඟුන සංගීත නිර්මාණ දෙකක් සඳහන් වරණය කුමක්ද?

i. පන්සිළු සහ ගොයම් දා මඟුල
ii. වැස්ස සහ අග්නි
iii. මානසවිල සහ අග්නි
iv. මාර පරාජය සහ සිංහල අවුරුද්ද
v. මහාභිනිෂ්ක්‍රමණය සහ දෙපානෝ

(...............)

21) "අන්ද්‍ර ගුවන් හැර නැංග අසුන් පිට
උපත පෙරා කලිඟු පුරා
සුද්ධෝදන රජුට දාව"
මේ ශාන්ති කර්ම ගී පිළිවෙලින් සඳහන් වරණය වන්නේ

i. උඩරට, සබරගමු, පහතරට
ii. උඩරට, පහතරට, සබරගමු
iii. සබරගමු, උඩරට, පහතරට
iv. පහතරට, සබරගමු, උඩරට
v. සබරගමු, පහතරට, උඩරට

(...............)

22) සංගීත රිද්මානුකූල බුද්ධිය පිළිවෙළ අදහස් දැක්වූ ඇමරිකානු දාර්ශනිකයා වන්නේ

i. හොවාර්ඩ් අර්ල් ගාඩ්නර්
ii. ජීන් පියාජේ
iii. ගිල්ෆර්ඩ්
iv. ඇල්ෆර්ඩ් බිනේ
v. සිග්මන් ෆ්‍රොයිඩ්

(...............)

23) "සුජාතා" චිත්‍රපටයේ ඇතුළත් ගීතයක් සහ එහි සංගීත නිර්මාතෘවරයා නිවැරදිව නම් කර ඇති වරණය තෝරන්න.

i. සඳරාහු මුඛයේහි - ආර්. මුත්තුසාමි
ii. සුදු සඳ එළියේ - සුනිල් ශාන්ත
iii. ශාන්ත මේ රාත්‍රියේ - මොහොමඩ් ගවුස්
iv. ආදර නදිය ගලා - බී.ඇස්. පෙරේරා
v. මන රංජන දර්ශනීය ලංකා - ආනන්ද සමරකෝන් (...............)


24) කණ්ඩායම් ගීතවල දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණයක් වනුයේ
   i. තබ්ලාව හා සර්පිනාව වාදනය කිරීම.
   ii. ස්වර සුසංවාද සහිතව ගායන වාදන ඉදිරිපත් කිරීම.
   iii. ගමක්, කෙටිතාන්, ආලාප වැනි සුවිශේෂී කොටස් භාවිතය.
   iv. කණ්ඩායම් ගී ගයමින් බයිලා නම් නැටුම් විශේෂය සමඟ බද්ධ වීම.
   v. ගීතය මැද උරුට්ටුව නමින් හඳින්වෙන සුවිශේෂී කොටසක් ගායනය. (...............)

25) බටහිර සංගීතයේදී ස්වරයේ හඬ ඉතා අඩුවෙන් ගායනය හෝ වාදනය කළ යුතු බව දක්වන සංකේතය වන්නේ
   i. *f* ii. Þ iii. *ff* iv. Þ Þ v. *mf*
   (...............)

26) පරිගණකය ආශ්‍රිත සංගීත පටිගත කිරීම් වැනි කාර්යන් සමඟ සම්බන්ධ නොවන මෘදුකාංගය කුමක්ද?
   i. Cubase
   ii. Cakewalk
   iii. Pagemaker
   iv. Reason Studios
   v. Adobe Audition
   (...............)

27) ගීතයේ මැද, දොහොරාවක් ඇතුළත් තාල රූප දෙකකින් යුතුව ගායනා කරන නූර්ති ගීතය කුමක්ද?
   i. සෝබමාන දේව පුරා
   ii. සීතා මා සිරියා ඉන්නේ
   iii. බන්දා මා දේ දෝ
   iv. පාද පාද දැන් නගා
   v. වාසනා දිනේකි මේක
   (...............)

- **අංක 28 සිට 30 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත ස්වර රූප සටහන උපයෝගී කරගන්න.**




28) ස්වර පුවරුවේ 3 - 8 - 11 - 15 යන අංක හිමි ස්වර එකවර හැඬ වූ විට නිකුත් වන කෝඩ් (chord) එක වන්නේ
   i. F - Major
   ii. F - Minor
   iii. G - Major
   iv. G - Minor
   v. C - Major
   (...............)

29) ආසාවරී මේලයට අයත් ස්වර අංක පිළිවෙලින් දක්වන්නේ කෙසේද?
   i. 1 - 2 - 3 - 4 - 6 - 7 - 10
   ii. 1 - 3 - 4 - 6 - 8 - 9 - 11
   iii. 1 - 3 - 5 - 6 - 8 -10 - 12
   iv. 1 - 3 - 5 - 7 - 9 - 10 - 12
   v. 1 - 4 - 5 - 7 - 9 - 10 - 13
   (...............)

30) අපරදිග සංගීතයේ කුඩා රේඛා මණ්ඩලයේ (Short Staff) රේඛා අතර පිහිටන ස්වර ස්ථාන 4 පිළිවෙලින් දක්වා ඇති වරණය කුමක්ද?

i. 1 - 3 - 5 - 8
ii. 3 - 6 - 10 - 13
iii. 6 - 10 - 13 - 17
iv. 5 - 7 - 11 - 12
v. 8 - 12 - 14 - 16

(..............)

- **අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවල ඇති හිස්තැන් සඳහා සුදුසුම පිළිතුර ලියන්න.**

31) "උස්තාද් අමීර්ඛාන්" නම් ගායන ශිල්පියා ...................................................... ගායන ශෛලියට සුප්‍රසිද්ධ වේ. "ධීර සමීරේ යමුනා තීරේ" ගීතය ...................................................... ගායනා ශෛලියට අයත්ය.

32) පණ්ඩිත් පන්නාලාල් ඝෝෂ් ...................................................... වාදනය සඳහා සුප්‍රසිද්ධ වන අතර උස්තාද් බිස්මිල්ලා ඛාන් ...................................................... නමැති සංගීත භාණ්ඩය වාදනයට සුප්‍රසිද්ධය.

33) ඉන්දියානු සංගීතය පිළිබඳ කරුණු ඇතුළත් ...................................................... ග්‍රන්ථය විමල් අබේසුන්දර මහතා විසින් රචනා කරන ලද අතර, වර්ෂ 1962 දී මුද්‍රණය වූ ...................................................... ග්‍රන්ථය ඩබ්.බී. මකුලොලුව මහතා විසින් සම්පාදනය කරන ලදී.

34) කවිකාර මඩුවේ සේවය කළ ...................................................... නම් කර්ණාටක සංගීතඥයා විසින් ...................................................... නාඩගම නිර්මාණය කරන ලදී.

35) කෝරල් සිම්ෆනිය (No. 9) ...................................................... සංගීතඥයාගේ නිර්මාණයක් වන අතර ජුපිටර් සිම්ෆනිය (No. 41) ...................................................... සංගීතඥයා විසින් නිර්මාණය කරන ලදී.

- **අංක 36 සිට 39 තෙක් ප්‍රශ්න සඳහා පහත ඡේදය කියවා පිළිතුරු සපයන්න.**

අළුවෙන් වැයෙන භාණ්ඩයක තත් තුනක් භාවිතයෙන් නිමන්සා විසින්

| ම ප නි - | ස̣ - ස̣ ස̣ | රි̇ රිගු රි̇ ස̣ | රි̇ නි ස̣ - | ලෙස මධ්‍ය ලය ගීතයේ අන්තරා කොටස ආරම්භ කරන ලදී. තබ්ලා වාදනයෙන් කාවින්දි ඇයට සහාය විය.

36) නිමන්සා වාදනය කළ සංගීත භාණ්ඩය ...................................................... වන අතර ඇය වාදනය කළේ ...................................................... රාගයයි.

37) කාවින්දි තබ්ලාවෙන් ...................................................... වාදනය කරන ලද අතර තබ්ලාව ......................................................පඩිවරයා නිපදවූ බව සඳහන්ය.

38) නිමන්සා වාදනය කළ රාගයේ ...................................... සහ ............................................. යන ස්වර වාදී හා සංවාදී ස්වර වේ.

39) එම රාගයේ මේලය ....................................... වන අතර එම රාගයේ ජාතිය ....................................... වේ.

40) පහත දැක්වෙන එක් එක් ස්වර ඛණ්ඩය අයත් නිර්දේශිත රාගය හඳුනාගෙන එම රාගයේ සමප්‍රකෘති රාගය නම් කරන්න.

a) රිමප , නි ධප - .......................................

b) රිමප , නි ධ ප - .......................................

41) "බඹරු ඇවිත්" චිත්‍රපටය සඳහා ...................................................... ශූරින්ද, "එක්ටැම් ගේ" චිත්‍රපටය සඳහා...................................................... ශූරින් ද සංගීත නිර්මාණයෙන් දායක වී ඇත.

42) කෝළම් රංග ශෛලියේදී ...................................................... නම් සුෂිර වාදන භාණ්ඩයත්, තාල වාදනය කිරීම සඳහා ...................................................... ත් භාවිත කර ඇත.

43) ධා ධා ති ට |ධා ධා තු නා | තා තා ති ට | ධා ධා තු නා | යන ................................................ ත්‍රිතාලයට අයත් වන අතර ධධ ති්ට ධධ තුනා | ධ+ වශයෙන් වූ අවනද්ධාක්ෂර කොටස තෙවරක් වාදනය කිරීම ................................................ නම් වේ.

44) ................................................, මුද්ගරිකාව, ................................................ මැද කනෙහි පිහිටන අස්ථිකා 3 වේ.

45) පෙරදිග, අපරදිග, චීන ................................................ , ................................................ යන සංගීත පද්ධති ලෝකයේ පිළිගත් සංගීත පද්ධති ලෙස සලකනු ලැබේ.

46) ................................................ ආභාසයෙන් සොකරි රංග සම්ප්‍රදායේ ගීතවල තනු නිර්මාණය වී ඇති අතර ................................................ රංග සම්ප්‍රදායේ ගීතවල තනු නිර්මාණය වී ඇත්තේ පහතරට ශාන්තිකර්ම ආභාසයෙනි.

47) "රිමප" යන ස්වර සංගතිය............................................ හා ................................................ යන **නිර්දේශිත** රාගවල නිරත යෙදේ.

48) සරල ශාස්ත්‍රීය ගීත වශයෙන් පිළිගැනෙන "හංසරාජනී" ගීතය ................................................ රාගය ඇසුරින් ද "හෝ පළු වනපෙත" ගීතය ................................................ රාගය ඇසුරින් ද නිර්මාණය වී තිබේ.

49) ගීතයක තනුව සමඟ යොදන සමාන්තර ස්වර රචනා ................................................ යන නමින් හැඳින්වෙන අතර, ගී පද අතරෙහි සම්බන්ධතාවය සඳහා යොදන කෙටි සංගීත ඛණ්ඩ ................................................ යනුවෙන් හැඳින්වේ.

50) කිසියම් තේමාවක් මත නිර්මාණය කරනු ලබන සංගීත සංරචනය ........................................... යනුවෙන් හැඳින්වෙන අතර බටහිර ගීත නාටකය ................................................ යනුවෙන් හැඳින්වේ.

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

අ.පො.ස (උසස් පෙළ) උපකාරක පරීක්ෂණය-**2024**
க.பொ.த (உயர்தர) உதவிப் பரீட்சை-2024
**Support Test Paper for G.C.E (A/L)**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 13 | විෂයය / பாடம் / Subject: පෙරදිග සංගීතය | පත්‍රය / வினாத்தாள் / Paper: II | පැය / மணித்தியாலம் / Hours: 03 |

උපදෙස් : I කොටසින් ප්‍රශ්න **දෙකකට** ද, II කොටසින් **එක් ප්‍රශ්නයකට** ද, III කොටසින් ප්‍රශ්න **දෙකකට** ද වශයෙන් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
(සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගින් ලැබේ.)

## I කොටස

1. නිර්දේශිත රාග තුනකට අයත් ස්වර ඛණ්ඩ තුනක් පහත දැක්වේ.

A. ග රි නි̣ ප̣ , ප̣ රි රි ග රි ස
B. ම ප නි සं , ම ග රි , රි ම ප
C. රි ග ම ග , රි ග̲ රි , නි̲ ධ ප
D. ම ධ නි̲ සं , සं නි̲ ධ , ම ග̲ රි

i. ඉහත රාග හතර හඳුනාගෙන අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමඟ පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 4)

ii. ඉහත රාග අතුරින් පංචමයේ භාවිතය නිසා රාග ජාතිය පිළිබඳව විවිධ මත ඇති රාගයට අදාළ මධ්‍යලය ගීතයේ හෝ වාදිතයේ **ස්ථායි කොටස** ස්වර ප්‍රස්තාර කර, මාත්‍රා 16 ක තානාලංකාර 2 ක් ලියා දක්වන්න. (ලකුණු 8)

iii. ඉහත රාග අතුරෙන් බිලාවල් මේලයට අයත් ඖඩව ජාති රාගයට අදාළ පල්ටාවක් (රාග ආශ්‍රිත ස්වර අභ්‍යාසයක්) උච්ච ෂඩ්ජය දක්වා ගොඩනගන්න. (ලකුණු 4)

iv. ඉහත දී ඇති "B" හි දැක්වෙන රාගයට අයත් සමප්‍රකෘති රාගය නම් කර එම රාග දෙකෙහි සමානතා 2 ක් හා අසමානතා 2 ක් ලියන්න. (ලකුණු 4)

2. පහත දැක්වෙන්නේ නිර්දේශිත රාග තුනකට අයත් විශේෂ ලක්ෂණ කිහිපයකි.

A. රිෂභය සහ ධෛවතය ආන්දෝලනය කෙරේ. නි̣ ස ග ම ධ̲ ධ̲ ප යන ස්වර සංගතිය යෙදේ.
B. දිවා දෙවන ප්‍රහරයේ ගැයෙන, ආරෝහණයේ ග නි ස්වර වර්ජිත උත්තරාංගවාදී රාගයකි.
C. මධ්‍යමය හා ධෛවතය වර්ජිතය ආරෝහණයේදී රිෂභය දුර්වල බවක් දැක්වෙතත් අවරෝහණයේදී ප්‍රබලව යෙදේ.

i. ඉහත රාග 3 හඳුනාගෙන අදාළ ඉංග්‍රීසි අක්ෂරය ද සමඟ පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 3)

ii. ඉහත රාග අතුරෙන් එක් රාගයකට අදාළව මධ්‍යලය ගීතයක හෝ වාදිතයක **අන්තරා කොටස** ප්‍රස්තාර කර, මාත්‍රා 8 කට නොඅඩු තානාලංකාර දෙකක් තාලානුකූලව ප්‍රස්තාර කරන්න. (ලකුණු 8)

iii. ඉහත (ii) කොටසට තෝරා නොගත් රාග අතුරෙන් එක් රාගයකට සමප්‍රකෘති වන නිර්දේශිත රාගය නම් කර, එම සමප්‍රකෘති රාග දෙක අතර සමානතා දෙකක් සහ අසමානතා දෙකක් ලියන්න. (ලකුණු 6)

iv. ඉහත (ii) සහ (iii) කොටස් සඳහා තෝරා නොගත් රාගයට අදාළව ස්වර සංගති තුනක් ලියා දක්වන්න. **(පළමු හා දෙවන ප්‍රශ්නවල සඳහන් ස්වර සංගති යොදා නොගන්න.)** (ලකුණු 3)

3.

i. ආවර්තයට හිමි මාත්‍රා සංඛ්‍යාවත්, එක් එක් විභාගයකට හිමි මාත්‍රා සංඛ්‍යාවත්, විභාග ගණනත් සමානව යෙදෙන නිර්දේශිත තාල දෙකක් නම් කරන්න. (ලකුණු 4)

ii. ඉන් එක් තාලයක් සමගුණ සහ දෙගුණ වශයෙන් ලියා දක්වන්න. (ලකුණු 5)

iii. එම තාල දෙකෙහි සමානතා තුනක් සහ අසමානතා තුනක් ලියන්න. (ලකුණු 6)

iv. එම තාල දෙක යොදා ගන්නා ගායන ශෛලීන් දෙකක් නම් කර ඉන් එක් ගායන ශෛලියක් පිළිබඳව කරුණු හතරක් ලියන්න. (ලකුණු 5)

## II කොටස

4.

i. ගැමි ගී, සංස්කෘතික හා සාමාජීය වශයෙන් අගය කළ හැකි අවස්ථා හතරක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 8)

ii. "ශ්‍රෝත්‍රික ගීත වශයෙන් වැදි ගී" යන මැයෙන් ඔබේ පාසැලේ බිත්ති පුවත්පත වෙනුවෙන්, උදාහරණ සහිතව ලිපියක් සකස් කරන්න. (ලකුණු 8)

iii. පාරු හෝ වැළපුම් ගීයක **මුල් පාදය** පමණක් ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 4)

5. නිර්දේශිත රංග සම්ප්‍රදායන් තුනකට අයත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

A. "සීතා මා සිරියා ඉන්නේ" ප්‍රචලිත ගී ඛණ්ඩයකි.

B. ගී තනු සඳහා කතෝලික "පසන් කන්තාරු" නාද මාලා බලපා ඇත.

C. පූර්ව රංගය හා අපර රංගය වශයෙන් කොටස් දෙකකින් යුක්තව රඟ දක්වයි.

i. ඉහත A , B , C වශයෙන් තොරතුරු ඇතුළත් රංග සම්ප්‍රදායන් තුන නම් කරන්න.(ලකුණු 6)

ii. එම සම්ප්‍රදායන් වලින් A හා B සම්ප්‍රදායන් දෙක පිළිබඳව කරුණු හයකින් යුත් සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න. (ලකුණු 6)

iii. නිර්දේශිත වෙනත් ගැමි රංග සම්ප්‍රදායක සංගීතමය තොරතුරු හතරක් ලියන්න.(ලකුණු 4)

iv. ඉහත A රංග සම්ප්‍රදායට අනුව හින්දුස්ථානි සංගීතයේ ඛ්‍යාල් ගායන ශෛලිය, තානාලංකාර යන ශිල්පාංගවල ආභාසය ලැබූ නූර්ති ගීත දෙකක් නම් කරන්න. (ලකුණු 4)




Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

## III කොටස

6. එක් මාතෘකාවකට කරුණු පහක් ඇතුළත් වන සේ පහත සඳහන් මාතෘකා හතරක් පිළිබඳව විස්තර කරන්න.

   i. සංගීතඥ ආචාර්ය ලයනල් එදිරිසිංහ
   ii. ජොහාන් සෙබස්තියන් බාක්
   iii. සංගීත චිකිත්සාවෙන් මනස සුවපත් වීම.
   iv. අමීර්ඛුස්රු පඬිතුමා
   v. වේද ගායනා භාරතීය සංගීතයට මුල් වීම.
   vi. භජන් ගායනා ශෛලිය (ලකුණු 5 x 4 = 20)

7. පහත දැක්වෙන බටහිර සංගීත ප්‍රස්තාර කොටස ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.




   i. ඉහත දැක්වෙන බටහිර ස්වර ප්‍රස්තාර කොටස පෙරදිග ක්‍රමයට නැවත ප්‍රස්තාර කරන්න. (ලකුණු 8)
   ii. ස්වර ප්‍රස්තාරය වාදනය කිරීමට වඩාත් සුදුසු හින්දුස්ථානි තාලය නම් කර ස්කේලය (Scale) සඳහන් කරන්න.
   iii. ඉහත ස්වර ප්‍රස්තාරයේ දැක්වෙන්නේ 1960 දශකයේ ශ්‍රී ලංකාවේ ජනප්‍රිය වූ චිත්‍රපට ගීතයක කොටසකි. එම ගීතයේ සංගීත නිර්මාණ පිළිබඳ කරුණු පහක් ඇතුළත් විස්තරයක් ලියන්න. (ලකුණු 5)
   iv. එම ප්‍රස්තාරයේ A, B, C වශයෙන් දක්වා ඇති සංකේත නම් කරන්න. (ලකුණු 1 x 3 = 3)

8. "කෙළෙස් දහමින් නොවී කම්පිත
   පහද දී තිළකුණු සිවුසස් මඟ"

   i. ඉහත ගී පාද දෙක වඩාත් ගැළපෙන තාලයකට අනුව ප්‍රස්තාර කරන්න. (ලකුණු 4)
   ii. එම පද ප්‍රස්තාරය සඳහා සුදුසු තනුවක් බාගේශ්‍රී **හෝ** ආසාවරී රාග ඇසුරින් නිර්මාණය කරන්න. (ලකුණු 8)
   iii. එම තනු නිර්මාණයට ගැළපෙන කෝඩ්ස් (chords) ස්වර ප්‍රස්තාරයේ සඳහන් කරන්න. (ලකුණු 8)



(9) WWW.PastPapers.WiKi (9)
Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!